 ISSN 2362-0412

# ශ්‍රී ලංකාවේ සමකාලීන විවාහය සහ ඒ හා බැඳි සමාජ ව්‍යූහ පිළිබඳ සති අන්ත පුවත්පත්වල මංගල දැන්වීම් ආශ්‍රයෙන් කෙරෙන සංස්කෘතික කියවීමක්

කේ. අයි. සංජීවනි
*සිංහල අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

sanjeewaniresha@gmail.com

**සාරසංක්ෂේපය**

අතීත සමාජ ක්‍රමයෙහි ස්ථාපිතව තිබූ විවාහය නමැති සංස්ථාව වත්මනට සාපේක්ෂව මූල්‍යමය හා සමාජමය වටිනාකම් සමඟ දැඩි ලෙස බද්ධව නොපැවති බව නිරීක්ෂණය කළ හැකිය. ලාංකේය සමාජයේ අධිරාජ්‍යවාදයේ ව්‍යාප්තියත් සමඟ විවාහය නීතිමය පැතිකඩක් සහිත සංස්කෘතික සංස්ථාවක් බවට පත්විය. එහිදී බහු පුරුෂ/ස්ත්‍රී විවාහය යන්නෙන් මිදී ඒක ස්ත්‍රී/පුරුෂ විවාහයට අවතීර්ණ විය. එසේ වුව ද පැරණි සමාජයේ උසස් යැයි සම්මත කරගත් පාරම්පරික සමාජ වටිනාකම් වලින් මිදීමට නොහැකි විය. කුලය, ජ්‍යෝතිෂ්‍යය ආදිය අදත් විවාහයේ දී සලකා බලයි. විවාහයට අත්වැල් සපයන එක් මාධ්‍යයක් ලෙස මංගල දැන්වීම් සඳහන් කළ හැකි ය. සමාජයේ විවාහය නමැති සංස්ථාව කිනම් මුහුණුවරක් ගනී ද යන්න ගවේෂණයේ දී මංගල දැන්වීම් ඒ සඳහා යොදාගත හැකිය. මෙහි දී සති අන්ත ලංකාදීප පුවත්පතේ එක මසක පුවත්පත්වල මංගල දැන්වීම් කෙරේ අවධානය යොමුකරමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී.මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මංගල දැන්වීම් වලින් ලංකාවේ සමාජ ව්‍යුහ කොතෙක් දුරට නිරාවරණය වේද යන්න විමසා බැලීමයි. මංගල දැන්වීම් හුදෙක් විවාහය හා සම්බන්ධ යෝජනා ලෙස පමණක් පෙනී ගිය ද ඒ ඔස්සේ නිරූපණය වන්නේ බහු විධ මානයන්ගෙන් යුත් ලංකාවේ සමාජ සංස්කෘතික පැතිකඩයි. මංගල දැන්වීම සමාජයේ යථා තත්ත්වය, සමාජ අපේක්ෂා ආදිය හෙළිකරන අතිශය සංක්ෂිප්ත ලියවිල්ලකි. එසේ ම සමාජය පිළිබඳ අසංක්ෂිප්ත කියවීමකි.

***ප්‍රමුඛපද*** *: අධිරාජ්‍ය වාදය, විවාහය, සමාජ ව්‍යුහ, මංගල දැන්වීම්, සමාජ අපේක්ෂා*